# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

## 10 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය කාලය : පැය 3

### I කොටස

(1) සක්විති රජවූවත් මුහුණ දීමට සිදුවන සතර බිය නම්,
1. ඡන්ද, චිත්ත, වීර්ය, විමංසා
2. ඡන්ද, ද්වේශ, මෝහ, භය
3. ජාති, ජරා, ව්‍යාධි, මරණ
4. මහල්ලෙක්, ලෙඩෙක්, මළකඳක්, පැවිදි රූපයක්

(2) ආරභථ - නික්ඛමථ - යුඤ්ජථ බුද්ධ ශාසනේ.... මෙම ගාථාව ඇතුළත් සූත්‍රය වනුයේ,
1. මහා මංගල සූත්‍රය
2. සිඟාලෝවාද සූත්‍රය
3. පරාභව සූත්‍රය
4. අරුණාවතී සූත්‍රය

(3) සිඟාලෝවාද සූත්‍රයට අනුව මහා සංඝ රත්නය ඇතුළත් වන දිශාව වනුයේ,
1. කුල දෙවියෝ ලෙස
2. බ්‍රහ්ම ලෙස
3. අප්පමඤ්ඤා ලෙස
4. උඩ දිශාව ලෙස

(4) තම අභිමතය පරිදි භාරමසක් භාවනා කර ප්‍රතිඵලයක් නොලැබ බුදුරජාණන් වහන්සේ වෙත එළඹ සිය චරිතයට ගැළපෙන කමටහනක් ලබා නොපමාව රහත් ඵලයට පත්වූයේ,
1. සැරියුත් හිමිය.
2. ස්වර්ණකාර හිමිය.
3. මුගලන් හිමිය.
4. ආනන්ද හිමිය.

(5) 'සන්දිට්ඨික' ගුණය ලෙස හඳුන්වා දිය හැක්කේ,
1. මනා පිළිවෙත් පුරන බැවිනි.
2. සියලු කෙලෙස් දුරු කළ බැවිනි.
3. තමා විසින් ම පිළිපැද ඇස් පනාපිට ප්‍රතිඵල දැකිය හැකි බැවිනි.
4. දමනය කිරීමට නොහැකි දරුණු පුද්ගලයන් දමනය කරන බැවිනි.

(6) කෙලෙස් පාලනය කර ගැනීමෙන් ලැබෙන ආනිශංසයක් නොවන්නේ,
1. විශ්වාසය ඇති වේ
2. රහසින්වත් පව් නොකරයි
3. ඇත්ත ඇති සැටියෙන් දැක ගනී
4. රෝග පාලනය කර ගත නොහැක

(7) භාවනාවට පිවිසෙන තැනැත්තෙකු තුළ තිබිය යුතු පූර්ව අවශ්‍යතාවයකි.
1. ඉන්ද්‍රිය සංවරය
2. වීර්යය
3. සති සම්පජඤ්ඤතාව
4. සන්තුට්ඨිතාව

(8) ජලය කැළඹී ඇත්නම් එහි කිසිවක් නොපෙනේ. එමෙන්ම සිත කැළැඹුණු විට නොසන්සුන් වූ විට මතකය අවධි නොවේ. මෙම අදහස දැක්වෙන නීවරණය වනුයේ,
1. උද්දච්ච කුක්කුච්ච ය
2. ව්‍යාපාදය
3. කාමච්ඡන්ද
4. ථීනමිද්ධය

(9) කුසල කර්ම, අකුසල කර්මාදී වශයෙන් හැඳින්වෙන දිගු කලක් නැවත නැවත කිරීමෙන් ප්‍රබලත්වයට පත්වන චේතනාව පෙරටු කොට ගත් ක්‍රියා සඳහන් ස්කන්ධය වනුයේ,

1. සංඛාර ස්කන්ධය
2. වේදනා ස්කන්ධය
3. සඤ්ඤා ස්කන්ධය
4. විඤ්ඤාණ ස්කන්ධය

(10) "ඇතුළත අවුල්ය. පිටත ද අවුල් ය. සත්ත්ව ප්‍රජාවට අවුලෙන් අවුලට වෙලී සිටියි" මෙම ප්‍රකාශය කළේ කවුරුන්ද? කොහේදීද?

1. දෙවියෙක් - ජේතවනාරාමයේදී
2. දෙවියෙක් - පූර්වාරාමයේදී
3. බ්‍රාහ්මණයෙක් - නිග්‍රෝධාරාමයේ
4. බ්‍රාහ්මණයෙක් - වේළුවනාරාමයේදී

(11) කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ උදව් ඇතිව සියම් රටින් උපසම්පදා භික්ෂූන් වහන්සේලා 20 නමක් වැඩම කරන ලද වර්ෂය වනුයේ,

1. 1752
2. 1753
3. 1735
4. 1725

(12) අවුරුදු 24ක් රජකළ දුටුගැමුණු රජතුමා වෙසක් උත්සව 24ක් පැවැත්වීය. එතුමා විසින් සාදන ලද වෙහෙර විහාර සංඛ්‍යාව වනුයේ,

1. 66 කි
2. 67 කි
3. 68 කි
4. 69 කි

(13) ඊතලය මහ වනයෙහි ඇද වැටුණු තැනම දිරාපත්ව යන්නාක් මෙන් අධිවේගී තරුණකම ද නිශ්ඵලව විනාශ වන බව දැක්වෙන උපදේශාත්මක ග්‍රන්ථය වනුයේ,

1. සිරිත් මල්දම
2. කායඝස්කරය
3. ලෝවැඩ සඟරාව
4. ධම්ම පදය

(14) නුවණින් පිරික්සා සිතා විමසා කටයුතු කිරීම, රෝග නිධානය විමසා පිළියම් කරන වෙදදුරෙකු මෙන් ක්‍රියා කිරීම, දොස් නිදොස් සොයා බලා නිදොස් දේ කිරීමසඳහා තිබිය යුතු හැකියාව හා දහම වනුයේ.

1. සුචිකම්ම
2. සඤ්ඤත
3. නිසම්මකාරී
4. ධම්මජීවී

(15) දුස්සීල ව නොසන්සුන් සිත් ඇතිව අවුරුදු සීයයක් ජීවත්වීමට වඩා සිල්වත්ව සන්සුන්ව සිත් ඇතිව එක් දවසක් ජීවත් වීම ශ්‍රේෂ්ඨය මෙම අදහස ඇතුළත් ධම්මපද ගාථාව වනුයේ,

1. ආරෝග්‍යා පරමා ලාභා.......
2. යෝ චේ වස්සසතං ජීවේ.......
3. සාදිතං වපතේ බීජං.......
4. සුභානුපස්සිං විහරන්තං.......

(16) සිඟාලෝවාද සූත්‍රයේ සඳහන් භෝග විනාශ මුඛ හයට අයත් නොවන්නේ,

1. අලසකමින් තොරවීම
2. සූදුවෙහි යෙදීම
3. පවිටු මිතුරන් ඇසුර
4. නොකල්හි විථි සංචාරය

(17) සමාජ කණ්ඩායම් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවය සමාජයේ යහපැවැත්මේ පදනමයි. ඒ සඳහා මඟපෙන්වා දෙන සූත්‍ර ධර්ම දේශනාව වනුයේ,

1. සිඟාලෝවාද සූත්‍රය
2. ව්‍යග්ඝපජ්ජ සූත්‍රය
3. මහා මංගල සූත්‍රය
4. කරණීයමෙත්ත සූත්‍රය

(18) පැවිදි පක්ෂය සය ආකාරයකින් ගිහියන්ට සංග්‍රහ කළ යුතු බව බුදුරජාණන් වහන්සේ වදාළහ. එසේ පැවිදි උතුමන් විසින් සිය දායකකාරකාදීන් ඉටු කරන යුතුකම් වනුයේ,

1. මැනවින් හික්මවීම
2. පවින් වැළැක්වීම
3. මෛත්‍රී සහගතව ක්‍රියා කිරීම
4. සමානාත්මතාවය දැක්වීම

(19) සමාජ විරෝධී, විනය විරෝධී හා නීති විරෝධී කියාවන් අපවටා සිදු වෙද්දිත් ඒ කිසිවෙක නොගැටී නොඇලී ඒ සියල්ලට ඉක්මවා ගිය පෞරුෂයක් ගොඩනගා ගැනීම. ඒ ජීවිතය හඳුන්වනුයේ,

1. තරුණ ජීවිතය
2. මහලු ජීවිතය
3. පත්මාකාර ජීවිතය
4. සොඳුරු විනෝදකාමී ජීවිතය

(20) සමාජයේ සමහරු ඉතා නොදියුණු මඩෙහි ගැලී සිටින නෙළුම් පොහොට්ටු වැනි ය. මෙසේ උපමා කළ පුද්ගලයා නම් කරනුයේ,

1. මධ්‍ය පුද්ගලයා ලෙසය
2. උතත්ම පුද්ගලයා ලෙසය
3. උපරිම පෞරුෂය ඇති පුද්ගලයා ලෙසය
4. අවම පුද්ගලයා ලෙසය

(21) "සමවායෝ එව සාධු"

1. සමානාත්මතාවය ම යහපතකි
2. සහජීවනය ම යහපතකි
3. සතර පෙර නිමිති දැකීම ම යහපතකි
4. සමඟිය යහපතකි

(22) මිනිස් වර්ගයා සසර දුකට පත්වීමට හේතු වූ මූලික ගැටලුව නම්,

1. ආහාර පාන හඟකම
2. කල්‍යාණ මිත්‍රයන් නොමැති වීම
3. සසර දුකට පත්වීම
4. සසර දුකට ප්‍රතිකාර නොමැති වීම

(23) යම් බීජයක් වපුරා ද ඒ අනුව ඵල ලැබේ. එසේම යහපත් ක්‍රියා තුළින් යහපත් විපාක ලැබේ. අයහපත් ක්‍රියා තුළින් අයහපත් විපාක ලැබේ. මෙම අදහස ඇතුළත් ධම්මපද ගාථාව වනුයේ,

1. යාදිසං වපතෙ බීජං.......
2. යෝ චේ වස්සතං ජීවෙ.......
3. අචරිත්වා බ්‍රහ්ම චරියං.......
4. මාතා පිතා දිසා පුබ්බා.......

(24) මට්ටකුණ්ඩලී නම් තරුණයා මරණාසන්න මොහොතෙහි බුදුරදුන් දැක සිත පහදවා ගත් පිනෙහි ප්‍රතිඵලයක් ලෙස දිව්‍ය ලෝකයෙහි ඉපදුනත් කොසොල් රජුගේ බිසව වන මල්ලිකාව අවසන් මොහොතේ සිතට නැගුණු අකුසල සිතුවිල්ලක් නිසා දුගතිගාමී විය. මෙයට බලපෑ කර්මය වූයේ,

1. ගරුක කර්ම
2. ආසන්න කර්ම
3. ආචින්න කර්ම
4. කටත්තා කර්ම

(25) කර්මයේ බලපෑම වෙනස් කර ගත හැකි පරිසර සාධකයක් නොවන්නේ,

1. ගති සම්පත්ති
2. අකාල සම්පත්ති
3. උපදි සම්පත්ති
4. ප්‍රයෝග සම්පත්ති

(26) අනාත්ම යනු

1. තම අභිමතයට අනුකූලව සිදුනොවීමයි
2. තම අභිමතයට අනුව සිදුවීමයි
3. තමා සියල්ල කිරීමයි
4. අනුන් විසින් සියල්ල කිරීමයි

(27) රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යනු පංචස්කන්ධයයි. මෙහි වේදනාවට උපමා කර ඇත්තේ,

1. පෙණ පිඬකටය
2. මිරිඟුවකටය
3. කෙසෙල් කඳකටය
4. දිය බුබුළකටය

(28) වෙනස්වීම, කැඩෙන බිඳෙන සුළු බව සියල්ල මොහොතින් මොහොත වෙනස් වන බව පෙන්වා දෙන ධර්මතාවය පත්තු වූ පහණ නිවී වයසට යෑම වැනි ය. මෙම සිදුවීම දැකිය හැක්කේ,

1. අනත්‍ය ලෙසය
2. දුක්ඛ ලෙසය
3. අනාත්ම ලෙසය
4. වේදනාව ලෙසය

(29) "ඉමස්මිං අසති ඉදං න හෝති" මෙම පිලි පාඨයේ සිංහල අදහස වනුයේ,

1. මෙය ඇති කල්හි මෙය වෙයි
2. මෙය ඉපදීමෙන් මෙය උපදී
3. මෙය නැති කල්හි මෙය නොවේ
4. මෙය නැති වී යාමෙන් මෙය නැතිව යයි

(30) "ඔබ වහන්සේ පැවිදි වූයේ කවරකු උදෙසාද? ඔබ වහන්සේගේ ගුරුතුමා කවරෙක්ද? කාගේ දහමක්ද ඔබ වහන්සේ රුචි කරන්නේ? " මෙසේ ප්‍රකාශ කළේ කවුරු විසින් කාහටද?

1. අස්සජි හිමියන් විසින් සැරියුත් හිමියන්ට
2. කෝලිත පිරිවැජියා විසින් අස්සජි හිමියන්ට
3. උපතිස්ස පිරිවැජියා විසින් අස්සජි හිමියන්ට
4. අස්සජි හිමියන් විසින් මුගලන් හිමියන්ට

(31) ගසක මුල ශක්තිමත්ව නොගැලවී පැවතින්නේ ද ඒතාක්කල් එම ගස නැවත නැවතත් ලියලන්නා සේ අප විසින් සිත්පසතන් තුළ තණ්හාව මුල් බැස ඇතිතාක් සසර දුක හට ගනී. මෙම උතුම් සත්‍යය නම්,

1. දුක්ඛ ආර්ය සත්‍යය
2. දුක්ඛ සමුදය ආර්ය සත්‍යය
3. දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය
4. දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය

(32) අකුසලය ද අකුසල මූලය ද කුසලය ද කුසල මූලයද අකුසලය ද අකුසල විපාකය ද කුසල ද කුසල විපාකය ද දැන ගන්නා ඥානය,

1. සම්මා සංකප්ප
2. සම්මා කම්මන්ත
3. සම්මා වායාම
4. සම්මා දිට්ඨි

(33) සමථ භාවනාව වඩන පුද්ගලයා ආචාර්යවරයෙකුගෙන් උපදෙස් ලබා ගැනීම අවශ්‍ය වේ. එහිදී තමාගේ චරිතයට අනුව කර්ම කර්මස්ථානයක් තෝරා ගත යුතුය. ඒ සඳහා තෝරා ගත හැකි කර්මස්ථාන ගණන,

1. 10
2. 20
3. 30
4. 40

(34) සතර මහා භූතයෝ,

1. ඡන්ද, චිත්ත, විරිය, විමංසා
2. ඡන්ද, ද්වේශ, මෝහ, භය
3. පඨවි, ආපෝ, තේජෝ, වායෝ
4. මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා

(35) වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජයාණන් වහන්සේ විසින් රචිත ග්‍රන්ථයක් නොවන්නේ,

1. මුණිගුණාලංකාරය
2. සාරාර්ථ සංග්‍රහය
3. සතර බණවර සන්නස
4. බුදුගුණාලංකාරය

(36) යම් ක්‍රියාවකට නුවණැති අය නින්දා කරත්නම් එබඳු කුඩා වූ වරදකින් පවා වැළකීමට උත්සාහ කළ යුතුය. මේ සඳහා උපදෙස් ලබා දෙනුයේ,

1. සිඟාලෝවාද සූත්‍රයයි
2. කරණීයමෙත්ත සූත්‍රයයි
3. වසල සූත්‍රයයි
4. වාසෙට්ඨ සූත්‍රයයි

(37) "පටිච්ච සමුප්පාද" යන යෙදුමෙන් කියවෙන්නේ,

1. සහේතුක බව ය
2. අහේතුක බව ය
3. සහේතුක හා අහේතුක බව ය
4. අනුසෝතගාමී බව ය

(38) සීලයේ පිහිටා කටයුතු කළ තැනැත්තාට මරණය බියකරු අත්දැකීමක් නොවේ. තමා සුගතියෙහිම උපදින බව හෙතෙම හොඳින් දනී. මේ සඳහා උදාහරණ කථා පුවතකි.

1. මල්ලිකා බිසවගේ කථාව
2. මාගන්දියාගේ කථාව
3. ධම්මික උපාසක කථාව
4. කොසොල් රජුගේ කථාව

(39) ධම්ම රත්නයේ ගුණ ගණන වන්නේ,

1. හයකි
2. නවයකි
3. දහයකි
4. අටකි

(40) මාගේ බුදුරජාණන් වහන්සේ ආර්ය මාර්ගය අනුගමනය කළ හෙයින් ද, නිර්වාණයට සැපවත් වූ හෙයින් ද යහපත් වචන ඇති හෙයින් ද

1. බුද්ධ නම් වන සේක
2. සුගත නම් වන සේක
3. අරහං නම් වන සේක
4. සම්මා සම්බුද්ධ නම් වන සේක

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **තෝරාගත් තවත් ප්‍රශ්න 4කට පිළිතුරු ලියන්න.**
- **පිළිතුරු ලිවිය යුතු සම්පූර්ණ ප්‍රශ්න ගණන 05කි.**

(1)

1. විපස්සනා භාවනාවට ප්‍රකාශිත වෙනත් නම් 02ක් ලියන්න.
2. පුද්ගල චරිත 6කි. ඉන් දෙකක් ලියන්න.
3. විසේසේන පස්සතීති විපස්සනා යන පාලි පාඨයේ සිංහල අදහස ලියන්න.
4. සීලයේ ආනිසංස 02ක් ලියන්න.
5. දුටුගැමුණු රජුගෙන් සිදු වූ ශාසනික සේවා 02ක් ලියන්න.
6. සමාදානය හා විරමනය යනුවෙන් ශිලයේ ප්‍රභේද 02කි. ඒ සඳහා වෙනත් වචන 02ක් ලියන්න.
7. සිඟාලෝවාද සූත්‍රයට අනුව සමාජය සය ආකාරයකි. දෙමව්පියන් හා ගුරුවරුන් නියෝජනය වන දිශාවන් ලියන්න.
8. බුදුදහමේ මූලික ඉගැන්වීම් 02ක් ලියන්න.
9. විපාක දෙන කාලය අනුව කර්මයේ ප්‍රභේද 02ක් ලියන්න.
10. මහා සංඝරත්නයේ සිදුවන සේවා 02ක් ලියන්න.

ලකුණු $(2 \times 10 = 20)$

(2)

1. සිඟාලෝවාද සූත්‍රය දේශනා කළේ කාහටද? (ල. 2)
2. සිඟාලෝවාද සූත්‍රයේ සඳහන් භෝග විනාශ මුඛ 03ක් ලියන්න. (ල. 3)
3. දෙමාපිය දූ දරුවන්ගෙන් ඉටුවිය යුතු යුතුකම් වගුවක් මඟින් පෙන්වන්න. (ල. 5)

(3)

1. උට්ඨානමතෝ සතිමතෝ...... ගාථාව සම්පූර්ණ කරන්න. (ල. 2)
2. එම ගාථාවේ තේරුම ලියන්න. (ල. 3)
3. ඉහත ධම්මපද ගාථාව පුද්ගල ජීවිත සාර්ථකත්වයට බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ල. 5)

(4)

1. අනුසෝතගාම හා පටිසෝතගාමි අතර ඇති වෙනස කුමක්ද? (ල. 2)
2. පත්ම උපමාව අනුව බුදුරදුන් වදාළ ත්‍රිවිධ පුද්ගලයන් නම් කරන්න. (ල. 3)
3. ඔබ පද්මාකාර ජීවිතයක් ගත කිරීමට අනුගමනය කරන ක්‍රියා මාර්ග කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 5)

(5)

1. සහජීවනය යනු කුමක්ද? (ල. 2)
2. සතර සංග්‍රහ වස්තුවලින් 03ක් ලියන්න. (ල. 3)
3. බෞද්ධ අනන්‍යතාව සුරකිමින් අන්‍ය ආගමිකයින් සමඟ ඔබ සහජීවනයෙන් කටයුතු කිරීමට අනුගමනය කරන ක්‍රියා මාර්ග කෙටියෙන් පහදන්න. (ල. 5)

(6)

1. කර්මය යනු කුමක්ද? (ල. 2)
2. දස අකුසලයෙහි මනෝ කම්මයට අයත් අකුසල කර්ම 03 නම් කරන්න. (ල. 3)
3. අකුසලයෙන් වැළකී කුසලයෙහි යෙදීමෙන් දෙලොව ජීවිතය සාර්ථක කරගත හැකිය. මේ පිළිබඳව ඔබේ අදහස් දක්වන්න. (ල. 5)

(7) පහත සඳහන් මාතෘකා යටතේ කෙටි සටහන් 02ක් ලියන්න.

1. අභියෝග ජයගත් සිදුහත් බෝසතාණෝ
2. ත්‍රිලක්ෂණය
3. මහා සංසරත්නයෙන් සිදුවන සේවා
4. සරණංකර හිමිපාණන්